# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/152/2022 (PSC)

ඩී.එම්.එස්. ද සිල්වා,
ශ්‍රී ලංකා පරිපාලන සේවය III,
**අභියාචක**

**එදිරිව**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව,

**වගඋත්තරකරු**

**දිනය :-2025.10.02**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක ඩී.එම්.එස්.ද සිල්වා,
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් එල්.එල්.සී ලොකුගේ මිය.

**-<u>නියෝගය</u>-**

## ජේ.ජේ.රත්නසිරි මැතිතුමා (සාමාජික) පරි.අභි.විනි. අධිකාරය

අභියාචක ඩී.එම්.එස්. ද සිල්වා, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පංතියේ නිලධාරිනියකි. ශ්‍රී ලංකා පරිපාලන සේවය සඳහා බඳවා ගැනීමේ 2006 වසරේ පැවැත්වූ විවෘත තරඟ විභාගය සමත් වී, 2006.10.02 දින සිට ආධුනික නිලධාරිනියක ලෙස ශ්‍රී ලංකා පරිපාලන සේවයට පත්වී ඇත. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 75/10/4620 හා 2012/12/11 දින දරණ ලිපියට අනුව අභියාචක,

I. පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2007.12.29 දින සමත් වී ඇත.
II. දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2008.09.20 දින සමත් වී ඇත.
III. දෙවන භාෂාව (දෙමළ) ලිඛිත පරීක්ෂණය 2012.09.28 දින සමත්වී ඇත. එසේ වුවත් දෙමළ භාෂාව පිළිබඳව වාචික පරීක්ෂණය පෙනී සිට නැත. එම නිසාම සේවා ව්‍යවස්ථාවේ කොන්දේසියක් වන දෙමළ භාෂා ප්‍රවීනතාවය සම්පූර්ණ වී නැත.

ඉන්පසුව අභියාචක **2021.12.08** දින රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද දෙමළ භාෂා වාචික පරීක්ෂණය සමත් වී ඇති බව රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල්ගේ අංක DOL/LAB/TLP/2019/2 හා **2022.01.13** දින දරන ලිපිය මගින් සනාථ කර ඇත. ඒ අනුව අදාළ සුදුසුකම් සපුරා ඇති බැවින් අදාළ දෙවන භාෂාව සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරන ලෙස ඉල්ලා සිටියද, රාජ්‍ය සේවා කොමිෂමට එම ඉල්ලීම සැළකිය නොහැකි බව දක්වා ඇත. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක **75/10/4620** හා **2022.10.28** දින ලිපිය මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව, අධ්‍යක්ෂක මගින් අභියාචක මේ පිළිබඳව දැනුවත් කර ඇත. රාජ්‍ය සේවා කොමිෂන් සභාව ලබාදුන් PSC/APP/4/23/**2015** හා **2022.09.21** දින දරණ එම තීරණයෙන් තෘප්තිමත් නොවූ අභියාචක **2022.12.16** දින, AAT/152/2022/PSC යටතේ මෙම අධිකාරයට අභියාචනයක් ඉදිරිපත් කර සිටී. අදාළ අභියාචනයේ **06** ජේදය අනුව,

"**i** **මා දෙවන භාෂා (දෙමළ) ප්‍රවීණතාවය ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම**

**ii.** **මා දෙවන භාෂා (දෙමළ) වාචික පරීක්ෂණයට පෙනී සිටීමට ප්‍රමාදවීම මාගේ පාලනයෙන් බැහැර වූ, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ප්‍රමාද දෝෂයක් මත සිදුවූවක් වන බැවින්, ප්‍රමාද වූ කාලයට සහන කාලයක් ලබා දීම හා මා දෙවන භාෂා (දෙමළ) ලිඛිත පරීක්ෂණය සමත් වූ 2012.04.28 දිනය දෙවන භාෂා (දෙමළ) ප්‍රවීණතාවය ලබාගත් දිනය ලෙස සළකා කටයුතු කිරීම සම්බන්ධයෙන් අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලා සිටිමි.**"

අභියාචකගේ ඉහත ඉල්ලීම සම්බන්ධව ලිපි රාශියක් විවිධ ආයතන වලට, විවිධ අවස්ථා වලදී ඉදිරිපත් කර ඇති බව යාකර ඇති ලේඛන අනුව පැහැදිලිව හඳුනාගත හැකිය.

අභියාචක මුදල් අමාත්‍යාංශයේ සේවය කරමින් සිටින අතරතුර **2012.06.06** දින සිට **2014.01.19** දින දක්වා කාලය, වැටුප් සහිත නිවාඩු ලබා, උසස් අධ්‍යාපනය සඳහා විදේශගතවී ඇත. අදාළ අධ්‍යයන කටයුතු අවසන් වී නැවත ලංකාවට පැමිණි පසුව තමාගේ සේවය ස්ථිර කර ගැනීම සඳහා දෙවන භාෂා අවශ්‍යතාවයෙන් දෙමළ භාෂාව නිදහස් කර දෙන ලෙස

සහ ප්‍රමාද කාලයට සහන ලබාදෙන ලෙස ඉල්ලා අවස්ථා කිහිපයකදී ඉල්ලීම් කර ඇති බව පහත ලිපි ලේඛන අනුව පැහැදිලිව ඔප්පු වේ.

I. 2014.09.03 දින අභියාචක විසින් අධ්‍යක්ෂක SLIDA වෙත ඉල්ලීමක් කර, දෙමළ භාෂාව වාචික පරීක්ෂණය සඳහා සහභාගී වීමට අවස්ථාව සළසා දෙන ලෙස දන්වා ඇත. ඒ පිළිබඳව කිසිදු ප්‍රතිචාරයක් ලැබුණ බව දැන ගන්නට නැත.

II. අභියාචක විසින් නැවතත් 2017.07.12 දින ඉල්ලීමක් කරමින්, 2017.07.14 දින අධ්‍යක්ෂ, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා 2017.07.21 දින මුදල් අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් මගින්, රජ්‍ය පරිපාලන ලේකම් වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.

III. එම ඉල්ලීමට පිළිතුරු ලෙස අධ්‍යක්ෂ SLIDA විසින් 2017.11.07 දින රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂක SLAS වෙත දන්වා ඇත්තේ, රු.1250/= ගෙවන ලෙස සහ ඒ අනුව අදාළ විභාගය සඳහා අවස්ථාව සළසා දීය හැකි බවත් ය. එසේ වුවත් එම ලිපියේ පිටපතක් මුදල් අමාත්‍යාංශයට හෝ අභියාචකට යොමු කර නැත. ඒ පිළිබඳව ඉදිරි ක්‍රියා මාර්ග ගත් බවක් ද දක්නට නැත.

IV. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂක SLAS විසින් 2023.10.25 දින ලිපියක් මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත යවමින් ඉහත ලිපියේ පිටපතක් ද අමුණා යවා ඇත. එහි පිටපතක් අභියාචකට ද යවා ඇත.

V. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, 2021.01.13 දින රාජ්‍ය පරිපාලන ලේකම් වෙත ලිපියක් යොමු කරමින් දක්වා සිටින්නේ, දෙවන භාෂාව (දෙමළ) සමත් වී, ඉන්පසුව සහන කාලයක් සඳහා ඉල්ලුම් කරන ලෙස අභියාචකට දැනුවත් කරන ලෙසය.

VI. ඉන්පසුව අභියාචක රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තව මගින් පවත්වන ලද දෙමළ භාෂා වාචික පරීක්ෂණයට 2021.12.08 දින සහභාගී වී, ඉන් සාමර්ථයක් ලබාගෙන ඇත.

VII. අභියාචක නැවතත් 2022.01.24 දින ලිපිය මගින්, අධ්‍යක්ෂක, කළමනාකාර සේවා දෙපාර්තමේන්තුව සහ 2022.01.27 දින මුදල් අමාත්‍යාංශයේ අතිරේක ලේකම් අත්සනින් සියළු

කරුණු දක්වා රාජ්‍ය පරිපාලන ලේකම් වෙත සහන ඉල්ලා ලිපියක් යොමු කර ඇත.

VIII. 2022.09.21 දින දරණ ලිපිය මගින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් විසින් ලේකම්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට දක්වා ඇත්තේ, අවස්ථා දෙකකදී ආයතන දෙකක් මගින් අදාළ විභාග සමත්වී ඇති නිසා, (SLIDA හා DOL) දෙවන භාෂාව සමත්වීමේ අවශ්‍යාවතාවය සපුරා ඇති බව පිළිගත නොහැකි බවය.

IX. අධ්‍යක්ෂ, SLIDA විසින් 2023.11.27 දින දරණ ලිපිය මගින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවට දක්වා සිටින්නේ, 2014.12.16 දිනෙන් පසුව දෙමළ භාෂාව පිළිබඳව වාචික පරීක්ෂණයක් තම ආයතයෙන් පවත්වා නැති බවය.

X. එසේම අධ්‍යක්ෂක SLIDA විසින් 2023.06.07 දින ලිපියක් මගින් අභියාචක දක්වා ඇත්තේ, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද විභාග ප්‍රතිඵල පිළිගැනීම පිළිබඳව විරෝධයක් නොමැති බවය.

XI. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් විසින් 2024.02.20 දින මෙම අධිකාරයට ලිපියක් යොමු කරමින් දන්වා සිටින්නේ, සහන කාලයක් ලබාදීමට කර ඇති ඉල්ලීම ප්‍රතික්ෂේප කරන බවයි. අදාළ ලිපියට අනුව හේතු ලෙස,

**2.** i. නිලධාරිනිය ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියට 2006.10.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි විවෘත පදනම මත පත්වීම් ලබා ඇති බැවින්, පත්වීම් ලිපියේ විධිවිධාන අනුව පරිවාස කාලය තුළ එනම්, 2009.10.02 දිනට පෙර අනික් රාජ්‍ය භාෂා (දෙමළ) ප්‍රවීනතාවය සම්පූර්ණ කළ යුතු බව.

ii. පහත දක්වා ඇති සුදුසුකම් අතුරින් ඕනෑම සුදුසුකමක් සම්පූර්ණ කිරීම මගින් නිලධාරිනියට එකී රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය සම්පූර්ණ කිරීමට හැකියාවක් තිබූ බව.

- අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයේ අදාළ වෛකල්පිත භාෂාවකින් සමත්වීම.
- අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයේන් පළමු භාෂාව හෝ දෙවන භාෂාව සමත්වීම.

- රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ මූලික හෝ උසස් භාෂා පාඨමාලාවන් සමත්වීම.
- රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ ප්‍රාරම්භක හෝ ඉහළ මට්ටමක භාෂා පාඨමාලාවක් සමත්වීම.
- රාජ්‍ය භාෂා කොමසාරිස් විසින් පිළිගනු ලබන සහතිකයක් ලබාදීම.
- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පවත්වනු ලබන රාජ්‍ය භාෂා ප්‍රවීනතා පරීක්ෂණය සමත්වීම.

iii. නිලධාරිනිය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් 2012.04.28 දින පවත්වනු ලද ලිඛිත පරීක්ෂණය සඳහා පෙනී සිටීමට පෙර පත්වීම් දින සිට වසර හයකට ආසන්න සේවා කාලය තුළ ඉහත කී අනුව අංක (ii) යටතේ සඳහන් එක් හෝ අවශ්‍යතාවයක් සමත් වී, රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය සම්පූර්ණ කිරීම සඳහා උත්සාහයක් දරා ඇති බවට තොරතුරු වාර්තා වී නොමැති බව.

iv. නිලධාරිනිය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් 2012.04.28 දින පවත්වනු ලද ලිඛිත පරීක්ෂණය සඳහා පමණක් පෙනී සිට ඇති බව සහ එම අවස්ථාවේ දී වාචික පරීක්ෂණය සඳහා පෙනී සිට නොමැති බව.

v. තවද, නිලධාරිනිය විදේශ අධ්‍යයන නිවාඩු අවසන් කර නැවත සේවයට වාර්තා කල 2014 වර්ෂයේ සිට 2020 වසර දක්වා කාලය තුළ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලනස ආයතනයෙන් වාචික පරීක්ෂණයක් සඳහා පෙනී සිටීමට ඉල්ලුම් කිරීම හැර ඉහත අනු අංක (ii) යටතේ සඳහන් එක් හෝ අවශ්‍යතාවයක් සමත් වී රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කිරීම සඳහා උත්සාහයක් දරා ඇති බවට තොරතුරු වාර්තා වී නොමැති බව.

vi. ඉහත සඳහන් නිරීක්ෂණයන් අනුව නිලධාරිනියට අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කිරීමට ප්‍රමාණවත් තරම් අවස්ථාවන් සංඛ්‍යාවක් ලැබී ඇති බැවින්, අදාළ අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට ප්‍රමාද වීම නිලධාරිනියගේ පාලනයනේ බැහැර කරුණක් හේතුවෙන් සිදුවී ඇති බවට සාධාරණීකරණය කිරීමට කරුණු නොමැති බව.

03. තවද උක්ත කරුණ සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ තීරණය ලබාදීමේ දී පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ද අවධානය යොමු කර ඇති බව වැඩිදුරටත් දන්වා සිටිමි.

i. අංක 22/2016(I) හා 2022.01.10 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි විධිවිධානයන් සහ මාගේ සමාංක හා 2023.09.05 දිනැතිව දන්වා ඇති කොමිෂන් සභා තීරණය අනුව ඩී.එම්.එස් ද සිල්වා මහත්මියට අනෙකුත් සේවා අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ඇත්නම් එම සේවයේ II සහ I ශ්‍රේණි වලට පිළිවෙලින් 2018.01.01 සහ 2020.01.01 දිනයන් වල සිට බලාත්මක වන පරිදි උසස්වීම් ලබා ගැනීම සඳහා දැනටමත් සහනයක් ලබාදී ඇති බව.

i. අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කිරීමට සිල්වා මහත්මිය විසින් අමතර වශයෙන් ගෙන ඇති කාලයට සහන කාලයක් ලබාදීමට කටයුතු කිරීම මගින් 2007.07.01 දිනයට පෙර බඳවා ගෙන ඇති සහ නියමිත කාල සීමාව තුළ දී අනෙක් රාජ්‍ය භාෂා අවශ්‍යතාවය නිසි පරිදි සම්පූර්ණ කර ඇති නිලධාරීන්ගේ ජ්‍යෝෂ්ඨත්වයට බලපෑම් සිදුවන බව.

අදාළ ලිපියේ එසේ සඳහන් කර තිබුණද, ඒ සියල්ල පිළිගැනීම අපහසුය. 22/2016 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනය අනුව දෙවන භාෂාව සමත්වීම සඳහා සහන කාලසීමාවක් ලබා දී ඇත. ඒ අනුව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ කණ්ඩායම් 05ක් සඳහා මෙම සහන ලබා දී ඇත.

| ශ්‍රී.ලං.පරි.සේවය | | සමත්විය යුතු දිනය | සහන කාලය |
|---|---|---|---|
| 1. | 2006.03.01 සීමිත | 2009.03.01 | 2014.03.30 |
| 2. | 2006.05.28 කුසලතා | 2009.05.28 | 2014.06.30 |
| 3. | 2006.10.02 විවෘත | 2009.10.02 | 2013.10.02 |
| 4. | 2007.02.15 සීමිත | 2011.02.15 | 2014.02.15 |
| 5. | 2007.03.12 උතුරු නැ/හිර විශේෂ සීමිත | 2010.03.12 | 2014.03.12 |

මේ අනුව අභියාචක වෙතද අදාළ සහනයන් හිමිවිය යුතුය. 2013.10.20 දිනට පෙර අභියාචක අදාළ පරීක්ෂණ වලින් සමත්ව ඇත. (දෙමළ භාෂා වාචික පරීක්ෂණය හැර) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 1/2014 VIII යටතේ ලැබිය යුතු සහනයන්ද අභියාචකට හිමිය. එසේ වුවත් අදාළ

සහන හෝ 22/2016 - 1 යටතේ ලබා දිය යුතු 2018.01.01 දිනට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පංතියට උසස් කිරීම සහ 2020.01.01 දිනට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තියට උසස් වීම සිදුකළ යුතු වුවද, මේ කිසිදු සහනයක් 2025 සැප්තැම්බර් මස අවසන් වී තිබියදීත් අභියාචකට ලබාදී නැත. මේ තුළින් අභියාචකට විශාල මූල්‍යමය පාඩුවක් සහ රාජකාරිමය ලෙස හිමිවිය යුතු වරප්‍රසාද කිසිවක් අදාළ කාලය තුළ ලැබී නැති බව පැහැදිලිවේ. අභියාචක ඉල්ලා සිටින II සහනය කෙසේ වෙතත් අඩුම තරමින් චක්‍රලේඛන පරිදි හිමිවිය යුතු සහනයන් වත් මේවන තුරු අභියාචකට ලබාදී නැත. මේ නිසාම අභියාචකට විශාල අසාධාරණයක් සිදුවී ඇති බව පැහැදිලිව පෙනේ.

අභියාචක දන්වා සිටින්නේ, තමාගේ පාලනයෙන් බැහැරව තිබූ කරුණු නිසා නිශ්චිත වේලාවට අනුව දෙවන භාෂා වාචික පරීක්ෂණයෙන් සමත්වීමට අපහසු වු බවය. අභියාචක වසර දෙකක් පමණ විදේශ අධ්‍යයන කටයුතු වල නිරතව සිටීම SLIDA ආයතනය මගින් නිශ්චිත කාලය තුළ අදාළ විභාග නොපැත්වීම සහ තමා කළ ඉල්ලීම් පිළිබඳව නිසි ප්‍රතිචාර දක්වා, අදාළ ඉඩ ප්‍රස්ථා සළසා නොදීම, තමාගේ පාලනයෙන් බැහැර වූ කරුණු බවයි. එසේ වුවත් අදාළ චක්‍රලේඛන වලට අනුව නියමිත සහන කාලය තුළ ලිඛිත විභාගය සමත් වී ඇත. ඒ අනුව අදාළ විභාගයෙන් 50% නියමිත කාලය තුළ ලිඛිත පරීක්ෂණයෙන් සමත් වි ඇති බව පිළිගැනීමට සිදුවේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව දන්වා සිටින පරිදි අභියාචකගේ පත්වීම ලිපියේ 14 වන වගන්තියේ “ඈ” ජේදය අනුව ගිවිසුම් ප්‍රකාරව අදාළ අවශ්‍යතා සපුරා ගැනීම අභියාචක සතු වගකීම වේ. ඉන් නිදහනස් වීමට අභියාචකට හැකියාවක් නැත. එසේ වුවත් ඒ සඳහා අවශ්‍ය ඉතිරි කටයුතු නියමිත වේලාවට විභාග දැන්වීම් ප්‍රසිද්ධ කිරීම ඉල්ලුම්පත්‍ර ලබා ගැනීම හා විභාග පැවැත්වීම සහ විභාග ප්‍රථිපල කඩිනමින් ලබාදීම ආයතන සතු වගකීමකි. එසේම අදාළ චක්‍රලේඛන ප්‍රකාරව ලබා දි ඇති සහනයන් ලබාදීම පරිපාලන බලධාරීන්ගේ වගකීම වේ. 2006 වසරේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පත්වීම් ලැබ නියමිත කාලය තුළ අදාළ අනිකුත් සුදුසුකම් සියල්ල සපුරා දෙවන භාෂාව පිළිබඳව ලිඛිත පරීක්ෂණයෙන්ද සමත්ව, ඉන් පසුව සහන කාලයක් තුළ වාචික පරීක්ෂණයද සමත්ව සිටින, විදේශගතව උසස් අධ්‍යාපනය හදාරා වගකිවයුතු තනතුරක සේවය කරන අභියාචකට වසර 20කට ආසන්න කාලයක් තිස්සේ III පංතියේ නිලධාරියෙකු ලෙස කටයුතු කිරීමට සිදුවීම කණගාටුදායක තත්ත්වයකි. පරිපාලන බලධාරීන් තම වගකීම් නිසි අයුරින් ඉටු නොකිරීම මෙහිදී

පැහැදිලිව දැකිය හැකිය. මේ නිසාම අභියාචකට මූල්‍යමය පාඩුවක් සහ වෙනත් රාජකාරි වරප්‍රසාද අහිමිවීමේ පාඩුව දීර්ඝ කාලයක සිට විඳීමට සිදුව ඇත. එහි වගකීම අභියාචක වෙත සම්පූර්ණයෙන්ම පැවරීම යුක්ති සහගත නැත. ඉහත සඳහන් සියලු කරුණු කෙරේ අවධානය යොමු කිරීමේ දී, නියමිත කාලය තුළ, දෙමළ භාෂාව වාචික පරීක්ෂණය සමත් වීමට නොහැකි වීම අභියාචකගේ පාලනයෙන් බැහැරව සිදුවී ඇති කරුණු ලෙස පිළිගැනීමට සිදුවේ.

දෙමළ භාෂා පරීක්ෂණය සමත්වීම පිළිබඳව රජය විසින් චක්‍රලේඛන 15කි පමණ නිකුත් කර ඇත. ඒ සියළු චක්‍රලේඛන වල අවසන් අරමුණ මේ තුළින් රාජ්‍ය නිලධාරීන් අපහසුතාවට ලක්කිරීම නොව තව තවත් සහන සළසා දීම සහ දෙමළ භාෂාව පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීමට අවස්ථාව සළසා දීමයි. ඉහත සියළු කරුණු කෙරේ අවධානය යොමු කරමින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දී ඇති PSC/APP/4/23/2015 හා 2022.09.21 දින තීරණය අහෝසි කිරීමට සහ අභියාචකගේ 2022.12.16 දින අභියාචනා පෙත්සමේ ඉල්ලීම් ලබාදීම සුදුසු බව යෝජනා කරමු. ඒ අනුව ඉදිරි පියවර ගන්නා ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාවට නියෝග කරමු.

මෙම නියෝගයේ පිටපත් අභියාචක, ලේකම්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වන්න.

අභියාචනය සඳහා ඉඩ දී ඇත.

(ජේ.ජේ.රත්නසිරි)
(සාමාජික)

මම එකඟ වෙමි

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

(එස්.නන්දසේකරන්)
(සාමාජික)

ලලිතා/-